# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2481/02 - 2026 මාර්තු මස 23 වැනි සඳුදා - 2026.03.23**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු 20 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මා විසින් සාදනු ලබන රෙගුලාසි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 මාර්තු මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි "**2026 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. පසුව සංශෝධනය වූ 2023 ජනවාරි 01 දිනැති අංක 2312/77 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කළ 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මෙමගින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

3. 2023 ජනවාරි 01 දිනැති අංක 2312/77 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල රෙගුලාසි අංක 3 හි කෙසේ සඳහන් වුවද, එකී රෙගුලාසිවල IV වන උපලේඛනයේ ලැයිස්තුගත කර ඇති **සංයෝජිත වර්ගීකරණ කේත 4012.13** යටතේ වර්ගීකරණය කර ඇති සහ අන්තර්ජාතිකව පිළිගත් ගුවන් සේවා බලධාරීන් විසින් නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලවන, නැවත අඩිය පිරවූ ගුවන් යානා ටයර්, අන්තර්ජාතික ගුවන් සේවා සපයන ශ්‍රී ලංකාවේ ගුවන් සේවා සමාගම් විසින් එකී ගුවන් සේවා සමාගම සහ සහතික කළ අන්තර්ජාතික සැපයුම්කරු අතර නිසිපරිදි ක්‍රියාත්මක සැපයුම් ගිවිසුමක් යටතේ, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ නිර්දේශයට යටත්ව ආනයනය කිරීම සඳහා මෙයින් අවසර දෙනු ලැබේ.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. ඉහත රෙගුලාසි අංක 3 යටතේ ආනයනය කරන ලද භාණ්ඩ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ මෙහෙයුම් සීමාවන් ඇතුළත පමණක් භාවිතා කළ යුතු වන අතර දේශීය වෙළෙඳපල වෙත නිකුත් කිරීම හෝ මෙරට තුළ අපහරණය කිරීම සිදු නොකළ යුතුය.

5. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත හෝ වෙනත් අදාළ ආයතන වෙත ''මෙහෙයුම් උපදෙස්'' නිකුත් කරනු ලැබිය යුතුය.

6. මෙම රෙගුලාසි 2028.03.31 දින දක්වා පමණක් බලාත්මක විය යුතුය.

EOG 03 - 0218

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.